Vidyodaya J. Arts, Sci.. Lett., Vol. 9 No. 1 & 2, January-July 1981. pp. 29-35

# සාහිත්‍යකලා පෝෂණය හා ආර්ථික සමෘද්ධිය අතර ඇති සම්බන්ධය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයේ සිංහල අධ්‍යයනාංශයේ
ඒ. වී. සුරවීර විසිනි

පොළොන්නරු යුගයේ ලීලාවතී රැජිණගේ පළමු රාජ්‍ය කාලයෙහි දී (ක්‍රි. ව. 1197-1200) සම්පාදනය කෙරුණු සසද කාව්‍යයේ එක් ගීයකින් කාව්‍ය කරණයට හිතකර පසුබිම කුමක් දැයි පැහැදිලි කෙරේ. ඒ ගීය මෙසේය:

බැඳුම් ද එ නියනෙ' — සුවෙනෙ' ද දෙසැ දන සිරින්
එ සිරි ගුණ නුවණ ඇති — මැති යුත් රජක්හු බෙලෙන්

(සසද කාව්‍යය: 10 ගීය)

'ඒ (කාව්‍ය) බන්ධනය ද (වනුයේ) ඥනයෙනි. ඒ (ඥනය වනුයේ) සුඛයෙනි. ඒ (සුඛය) ද (වනුයේ) දෙශයෙහි ධන සම්පත්තියෙනි. ඒ සම්පත්තිය (වනුයේ) ගුණය ද ඥනය ද ඇති අමාත්‍යයන් සහිත වූ රාජයකු ගේ බලයෙනි.'[1]

මෙම ගීයෙහි කාව්‍ය බන්ධනය ගැන පමණක් කරුණු සඳහන් වෙතත් එහි පැවසෙන කරුණු සාහිත්‍ය කලා සම්බන්ධයෙන් ද පොදුවේ සාධාරණ සේ සැලකීමේ වරදක් නොපෙනේ. සාහිත්‍ය කලා පෝෂණයට හේතු වන්නා වූ සාධක ඒ තනි ගීයෙන් මනා සේ පිඩු කොට දක්වෙයි. කාව්‍ය නිර්මාණ පහළ වනුයේ රටේ ඥන සම්පත් ඇති වූ කල්හි බවත්, ඒ ඥන සම්පත් සිද්ධ වනුයේ සෞඛ්‍ය වර්ධනය ඇති කල්හි බවත්, සෞඛ්‍ය වර්ධනය සිද්ධ වන්නේ රටේ ධන සම්පත් ඇති කල්හි බවත් පැහැදිලි ලෙස එහි දක්වා ඇත්තේය. ඥන පෝෂණයටත් සෞඛ්‍ය වර්ධනයටත් ධන සම්පත්තිය ම මුල් වෙයි. ඒ අනුව රටක සාහිත්‍යකලා පෝෂණය සඳහා ආර්ථික සංවර්ධනය ම මූලික වන බව සසද කතුවරයාගේ මතය විය.

මෙකී සියලු සම්පත්තිය සිද්ධ වනුයේ ගුණය ද ඥනය ද ඇති අමාත්‍යයන් සහිත වූ රාජයකුගේ බලයෙන් බව පූර්වෝක්ත ගීයෙන් ප්‍රකාශිතයි. මෙම තත්වය සාධාරණ වනුයේ රාජ්‍ය පාලනය පැවති පුරාණ කාලයට පමණය. එසේ ම මෙම ගීය ලීලාවතී බිසෝ වැනුමට අයත් වන්නක් බව ද අමතක නොකළ මනාය. එබැවින් ගීයේ මුල් දෙපාදයෙන් පැවසෙන අදහස් කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීමට අපි අදහස් කරමු.

දෙළොස් වන සියවස මුල් භාගයේ දී සිංහල කවියකු විසින් ඒ පවසන ලද්දේ ඊට අවුරුදු හත්සිය ගණනකට පසුව කාල් මාක්ස්, ෆෙඩ්රික් එංගල්ස් යන ආර්ථික හා දේශපාලන විද්‍යා විශාරදයන් ඉදිරිපත් කළ මතයට ළං වන්නක් බව පෙනේ.

The German Ideology (ජර්මන් දෘෂ්ටිමාර්ගය) නමින් 1846 දි පූර්වෝක්ත මාක්ස්, එංගල්ස් යන ලේඛකයන් දෙදෙන සාමූහිකව පළ කළ ග්‍රන්ථයෙහි මෙවැනි ප්‍රකාශයක් වෙයි :

1. මුනිදස කුමාරතුංග, සසද විවරණය, රත්නාකර යන්ත්‍රාලය, බු. ව. 2483, 71 පි.

> 'මිනිසාට අදහස්, සංකල්ප සහ විඥාන පහළ වීම වනාහි මුලින් ම ඔවුනොවුන් ආශ්‍රය කිරීමට උපයෝගී කරගනු ලබන මාධ්‍යය හා එක එල්ලේ ම බැඳී පවතින්නකි. මෙම ආශ්‍රය මිනිසාගේ මූලික අවශ්‍යතාවක් ද වෙයි. ආශ්‍රය සඳහා මිනිසා විසින් උපයෝගී කරගනු ලබන මාධ්‍යය නම් භාෂාවයි. අදහස් පිළිසිඳ ගැනීම, සිතීම සහ ඔවුනොවුන් හා ඇසුරු කිරීම යන දෑ මිනිසාගේ භෞතික ක්‍රියාකාරිත්වයේ ස්වාභාවික ප්‍රවාහයක් සේ පෙණේ ......... මිනිසාගේ චිත්ත සන්තානයේ යම් යම් අවබෝධයන් පහළ වන්නේ ඔහුගේ නිපදවීම් වශයෙන් මය. වෙනත් වචනවලින් කියතොත් ඒ අවබෝධයන් ඇති කෙරෙනුයේ මිනිසා විසින් මය......... අපේ මේ මතවාද ගොඩනැඟීමට පදනම් කර ගත්තේ නියම ක්‍රියාකරී මිනිසාය. මිනිසාගේ ජීවන මාර්ගය පදනම් කරගෙන අපි එහි දෘෂ්ටිමය ප්‍රතිරූපයේ සහ ප්‍රතිරාවයේ වර්ධනය පැහැදිලි කරමු...... ජීවිතය සකස් කරනු ලබනුයේ විඥානය විසින් නොවේ; ජීවිතය විසින් විඥානය සකස් කරනු ලබයි'[2]

මෙම ප්‍රකාශය අන්තර්ගත ග්‍රන්ථයේ අරමුණට අනුකූලව ම එය එක් ආකාරයක ගුප්ත වූ ද, දර්ශනික වූ ද ස්වරූපයක් දරන හෙයින් වටහා ගැනීම පවා දුෂ්කර සේ පෙණේ. එහෙත් 1859 දී පළ කරනු ලැබූ කාල් මාක්ස්ගේ A Contribution to the Critique of Political Economy නම් ග්‍රන්ථයෙහි පූර්වෝක්ත කරුණ වඩාත් පැහැදිලි ලෙසින් දක්වේ. මාක්ස්වාදී සංස්කෘතික චින්තනයේත් සාහිත්‍යකලා අවබෝධයේත් පදනම එහි අන්තර්ගත වන බව සැලකිය හැකි හෙයින් එහි ඉදිරිපත් කෙරෙන කරුණු ප්‍රයෝජනවත් වෙයි.

> 'සමාජයෙහි ජීවත් වීමේ කාර්යයේ දී මිනිසා විසින් අත්‍යවශ්‍ය වූ නිශ්චිත සම්බන්ධතා ඇති කර ගනු ලැබේ. මේ සම්බන්ධතා ඇති කර ගැනීම ඔහුගේ කැමැත්තට අනුව ම සිදු වන්ණේ නැත. මෙසේ ඇති කර ගනු ලබන සම්බන්ධතා වනාහි මිනිසාගේ භෞතික නිෂ්පාදන බලවේගයන්ගේ වැඩීමෙහි නිශ්චිත අවස්ථාවන්ට අනුකූල වන්නා වූ නිෂ්පාදනය මුල් කර ගත් සම්බන්ධතා වෙයි. මෙම නිෂ්පාදන සම්බන්ධතා සියල්ල එකතු වීමෙන් සමාජයේ ආර්ථික සංස්ථිතිය ඇති වෙයි. නීතිය පිළිබඳ වූ ද දේශපාලනමය වූ ද, උපරිෂ්ඨානයෙහි (=මතුමහලෙහි) නියම අධස්ථානය (=අඩිතාලම, පදනම) වනාහි සමාජයේ ආර්ථික සංස්ථිතියයි. එසේ ම, මෙම ආර්ථික සංස්ථිතිය සමග සමාජ විඥානයේ නිශ්චිත ස්වරූප ද සැසඳෙන්ණේය. භෞතික ජීවිතයේ නිෂ්පාදන මාර්ග සාමාන්‍ය වශයෙන් සාමාජික, දේශපාලනමය සහ බුද්ධිමය ජීවන රටාව හැඩගස්වයි. මිනිසාගේ පැවැත්ම සකස් කෙරෙනුයේ ඔහුගේ විඥානය විසින් නොවේ. අනෙක් අතට මිනිසාගේ විඥානය සකස් කෙරෙනුයේ ඔහු සමාජයේ පිහිටන ආකාරය විසිනි.'[3]

මාක්ස්, එංගල්ස් දෙදෙනාගේ මතය අනුව මිනිසුන්ගේ අන්‍යෝන්‍ය සම්බන්ධතා ඔවුන් භෞතික ජීවිතය හැඩගසා ගන්නා ආකාරය හා බැඳී පවතී. පූර්වෝක්ත නිෂ්පාදන බලවේග හා 'සමාජ සම්බන්ධතා' එකිනෙකට නෑකම් දක්වයි.

---

2. Karl Marx and Fredrich Engles, *The German Ideology*, Tr. Progress Publishers, Moscow, 3rd Revised ed. 1976, p. 42.
3. Karl Marx, *A Contribution to the Critique of Political Economy*, Tr. Progress Publishers. Moscow, 2nd Printing, 1977, Preface, p. 20.

මේ කරුණුත් සංස්කෘතිය හා සාහිත්‍යකලා ක්ෂේත්‍රත් අතර ඇති සම්බන්ධය කුමක් දැයි ප්‍රශ්නයක් මතු විය හැකිය. මේ දෙදෙනාගේ තර්කය අනුව නිෂ්පාදන බලවේග හා සම්බන්ධතා නිසා සමාජයේ ආර්ථික සංස්ථිතිය සකස් වෙයි. මෙය මාක්ස් සහ එංගල්ස් හැඳින්වූයේ ආර්ථික අධස්ථානය හෙවත් අඩිතාලම යනුවෙනි. මෙම අඩිතාලම මුල් කර ගෙන එක් එක් යුගයේ දී එක් එක් උපරිෂ්ඨානයක් හෙවත් මතුමහලක් ගොඩ නැගේ. පාලන තන්ත්‍රය, නීතිරීති, දේශපාලන ක්‍රම යනාදිය මෙන් ම දේශපාලනමය, ආගමික, සාරධර්මය, සෞන්දර්යාත්මක (=සාහිත්‍යකලා) යනාදි සමාජ විඥානයේ අංගලක්ෂණ ද යට කී මතුමහලට අයත් වෙයි. රටක සාහිත්‍ය කලා අවබෝධය සඳහා පූර්වෝක්ත අඩිතාලම සහ මතුමහල අතර ඇති සම්බන්ධය තේරුම් ගැනීමේ අවශ්‍යතාව අවධාරණය කරන ලද්දේ එහෙයිනි.

සමාජ මතුමහලේ ඒකදේශයක් වන සාහිත්‍යකලා පහළ වන්නේ ඒ සමාජයේ ආර්ථිකය නමැති අඩිතාලම මුල් කරගෙනය යන මාක්ස් එංගල්ස් සිද්ධාන්තය හා යට කී සසද කාව්‍ය කර්තෘගේ ප්‍රකාශය අතර ලොකු ගැටුමක් නොමැති සේය. සසද කවියා එක ගීයකින් තම අදහස පැවසුවා මිස ඒ පිළිබඳ විවරණයක් කිරීමට ඉදිරිපත් නොවූයේය. මාක්ස් සහ එංගල්ස් සමාජ සංවිධානයත් සාහිත්‍යකලා පහළ වීමත් ගැන දීර්ඝ වශයෙන් අදහස් ඉදිරිපත් කළහ. එහි දී, ආර්ථික පදනමත් සාහිත්‍යකලා නමැති මතුමහලත් අතර සම්බන්ධය පිළිබඳ සිද්ධාන්තයෙහි පිහිටා ගෙන ම උසස් සාහිත්‍යකලා පහළ වීම සඳහා ආර්ථික දියුණුව අනිවාර්ය අවශ්‍යතාවක් සේ සැලකීමට ඔවුහු යුහුසුලු නොවූහ. මෙහි ලා ඔවුන් ඉදිරිපත් කරන අදහස් නම් සසද කවියාගේ අවධානයට පාත්‍ර වී නොමැත.

> 'කලා නිර්මාණ සම්බන්ධයෙන් සලකන කල ඇතැම් ශ්‍රේෂ්ඨ නිර්මාණ පහළ වූ අවස්ථා හා ආර්ථික දියුණුව ඇතුළු පොදුවේ සමාජ ප්‍රගතිය ඇති වූ යුග අතර නිශ්චිත සම්බන්ධතාවක් නොමැති බව ප්‍රකට කරුණකි.'[4]

මේ ද කාල් මාක්ස් ගේ කියමනකි. මෙම මතය සනාථ කිරීම සඳහා ඔහු තෝරා ගත් එක් උදහරණයකි ග්‍රීක කලාව. අදත් ලෝකයා විසින් අගය කරනු ලබන ග්‍රීසියේ උසස් කලා නිර්මාණ පහළ වූ යුගය ආර්ථික අතින් එතරම් සමෘද්ධිමත් කාලපරිච්ඡේදයක් නොවූ බව මාක්ස් පෙන්වා දෙයි. ග්‍රීසියේ ආර්ථික සමෘද්ධියක් නොතිබිය දීත් ශ්‍රේෂ්ඨ කලා පහළ වූ බව නොව ආර්ථික අස්ථිරතාව හේතු කොට ගෙන ශ්‍රේෂ්ඨ කලා පහළ වූ බව ඔහු දරූ මතයයි. එසේ ම වීර කාව්‍ය වැනි ඇතැම් වැදගත් සාහිත්‍යාංග පහළ වන්නේ නොදියුණු සමාජයන්හි බව මාක්ස් ගේ මතයයි. මාක්ස් ගේ තර්කය වූයේ රටක ආර්ථික සමෘද්ධිය හේතු කොට ගෙන ශ්‍රේෂ්ඨ කලා පහළ වන්නා සේ ම ආර්ථික පරිහාණියේ ප්‍රතිඵලයක් වශයෙන් ද ශ්‍රේෂ්ඨ කලා පහළ වන බවය. මේ අවස්ථා දෙකේ දී ම ආර්ථික පදනම ඉස්මතු වෙයි.

මේ අනුව මාක්ස්, එංගල්ස් යන දෙදෙනාගේ යට කී මූලික මත දෙකෙහි- එනම් (i) සාහිත්‍යකලා නමැති මතුමහල සහ ආර්ථික සංවිධානය නමැති අඩිතාලම අතර සම්බන්ධයක් ඇති බව, (ii) ශ්‍රේෂ්ඨ කලා නිර්මාණ අවශ්‍යයෙන් ම රටක ආර්ථික සංවර්ධනය ඇති කල්හි පමණක් නොව එසේ නොමැති කල්හි ද පහළ වන බව යන මත දෙකෙහි ප්‍රතිවිරෝධයක් නොමැති බව පැහැදිලි වෙයි.

---

4. See : *Marxism And Literary Criticism,* Terry Eagleton, London, Reprint 1977 p. 10 Quote.

සසද කවියා පවසා ඇත්තේ උසස් කාව්‍ය නිර්මාණ පහළ වීම සඳහා වෙනත් කරුණු අතර දේශයේ ධන සම්පත්තිය ද පාදක වන බවය. ඔහු ගේ අදහස වූයේ ලීලාවතී බිසවගේ රාජ්‍ය සමය එවැන්නක් වූ නිසා එකල උසස් කාව්‍ය නිර්මාණ පහළ වන බව පැවසීමය. එහෙත් සැබැවින් ම එකල එතරම් සමෘද්ධිමත් තත්වයක් නොවීය. පොළොන්නරු යුගයේ සමෘද්ධිය ඊට බොහෝ කලකට පෙර අවසාන වී ගිය බව ඉතිහාසයෙන් පෙනේ.

ලෝකයේ මෙතෙක් පහළ වූ ශ්‍රේෂ්ඨතම නවකතාකරු ලෙස සලකනු ලබන ලියෝ තොල්ස්තෝයි, අද්විතීය කෙටිකතා සහ නාට්‍ය රචකයකු වූ ඇන්තන් චෙකොව් වැනි ලේඛකයන් පහළ වූයේ රුසියාව සාර් පාලනය නිසා ආර්ථික පරිහාණියට පාත්‍ර වී තුබූ යුගයකය. රුසියානු සමාජ මතුමහලෙහි අංගයක් වන සාහිත්‍යය තොල්ස්තෝයි වැනි ලේඛකයන් විසූ අවධියෙහි ශ්‍රේෂ්ඨත්වයට පැමිණියේ එද පැවති ආර්ථික අඩිතාලමෙහි සමෘද්ධිය හේතු කොටගෙන නොවේ. ඒ ශ්‍රේෂ්ඨ සාහිත්‍යය පහළ වූයේ ඒ සමාජ ආර්ථික බලවේගයන්ගේ පීඩාකාරී තත්වය හේතු කොටගෙනය.

වර්තමාන ලෝකයේ ආර්ථික අතින් අතිශයින් සමෘද්ධිමත් රට අමෙරිකා එක්සත් ජනපදය යි කියනු ලැබේ. දේශයක ධන සම්පත්තිය සාහිත්‍යකලා වර්ධනයට ඒකාන්ත හේතුව වන්නේ නම් අද ලෝකයේ ශ්‍රේෂ්ඨතම සාහිත්‍යකලා පහළ විය යුත්තේ ඒ රටෙහිය. එහෙත් එය එසේ ම නොවන බව අපි දනිමු.

මේ පිළිබඳව තතු පැහැදිලි කර ගැනීම සඳහා අප්‍රිකානු රටවල තත්ත්වය පරීක්ෂා කිරීම සුදුසු සේ පෙනේ. ඉකුත් දශක කීපය තුළ අප්‍රිකානු මහාද්වීපයේ මධ්‍යම නැගෙනහිරි සහ බටහිරි රටවල ලේඛකයන් අතින් පෙර නොවූ විරූ උසස් නවකතා හා කාව්‍ය සාහිත්‍යයක් නිර්මාණය වූයේය.

> ‘පරිපීඩනය සහ මර්දනය වඩාත් උග්‍ර වූයේය. නාගරිකත්වය වැඩි වූයේ ය. ලිවීමේ කියවීමේ හැකියාවන් වැඩි වූයේය. සංවිධානාත්මක දේශපාලන ව්‍යාපාර දියුණු වූයේය. සැකය විරෝධතා ප්‍රකාශනය බවටත්, අද්භූතය යථාර්ථය බවටත් පරිවර්තනය වූයේය. මෙපරිද්දෙන් සටන්වාදී සාහිත්‍යයක් පහළ වූයේ ය. අද්‍යතන දක්ෂිණ අප්‍රිකානු සාහිත්‍යයේ මූලික තේමාව වූයේ අපේක්ෂාව, විරෝධය, හිංසාකාරී භාවය, පීඩනය, විරුද්ධවාදීන්ගෙන් පිරුණ ලෝකයක ජීවත් වීම සඳහා සටන් වැදීම, අනන්‍යතා ගවේෂණය. අන්‍යෝන්‍ය සම්බන්ධතා පැවැත්වීම, බන්ධනයන්ගෙන් මිදීම, විමුක්තිය යනාදියයි.’[5]

මේ දක්වූයේ හර්බට් එල්. ෂෝ පවසන පරිදි අප්‍රිකානු සමාජයේත් සාහිත්‍යයේත් ස්වභාවයයි. එහෙත් ඉකුත් දශක කීපයේ දී තරම් දියුණු සාහිත්‍යයක් ඒ ප්‍රදේශයේ කිසි දක පහළ වූයේ නැත. මේ සාහිත්‍යය පහළ වූයේ දිගු කලක් යටත් විජිත පාලනයේ ග්‍රහණය නිසා මානසික වූ ද, ආර්ථික වූ ද පරිපීඩනවලට ගොදුරු වී සිටි, තව මත් ඒ පරිපීඩනයන්ගෙන් දුක් විඳින සමාජයක් තුළිනි. ඒ සාහිත්‍යය නමැති මතුමහල තුළ සමාජ - ආර්ථික අඩිතාලමෙහි සලකුණු අවශ්‍යයෙන් ම සටහන් වී ඇත්තේය. ඒ ආර්ථික සංස්ථානය අප්‍රිකානුවන්ට නම් කිසි සේත් හිතකර හෝ සමෘද්ධිමත් එකක් නොවීය.

5. *Come Back Africa*, ed. by Herbert L. Shore and Megchelina Shore-Bos, Seven Seas Books, 1975. p. 29

මිනිසා ඔවුනොවුන් අතර මෙන් ම පොදු සමාජය සමගත් සම්බන්ධතා පැවැත්වීමේ අතිශයින් අර්බුදකාරී අවස්ථාවන්හි ශ්‍රේෂ්ඨ සාහිත්‍ය නිර්මාණ පහළ වන බව The Hidden God නමින් ග්‍රන්ථයක් සම්පාදනය කරන ලූෂන් ගෝල්ඩ්මාන් නම් ලේඛකයා පැහැදිලි කරයි.[6]

යුද්ධාදී අර්බුදයන්ගෙන් තොර, රට වැසියා සුඛිත මුදිත වූ, එසේ ම ආර්ථික සමෘද්ධිය ඇති අවධිවල ශ්‍රේෂ්ඨ සාහිත්‍ය කලා නිර්මාණ පහළ නොවන බවක් පූර්වෝක්ත කරුණුවලින් කිසි සේත් ගම්‍යමාන නොවන බව සැලකිය යුතුය.

රට වැසියාගේ ඥාන සම්පත්තිය දියුණු වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රේෂ්ඨ සාහිත්‍ය කලා පහළ වන්නේ ආර්ථික අතින් ද දියුණු අවධිවල ය යන මතය අප රට සම්බන්ධයෙන් කෙතෙක් දුර සත්‍ය දැයි විභාග කරමු. සාහිත්‍යකලා ඉතිහාසය හැදෑරීමේ දී අප පුරුදු වී සිටින්නේ අනුරාධපුර, පොළොන්නරු, දඹදෙණි ආදී වශයෙන් එක් එක් රාජ්‍ය යුගය සමස්තයක් වශයෙන ගෙන සලකා බැලීමටය. උදහරණයක් වශයෙන් අනුරාධපුර යුගය ගතහොත් එයට අනුරාධපුරයේ මුල් ජනාවාස පිහිටුවනු ලැබූ සේ සැලකෙන විජය කාලයේ පටන් එකොළොස් වන සියවසේ මුල් භාගයේ දී පස් වන මිහිඳු රජු සොළී ආක්‍රමණිකයන්ගේ යටතට පත් වන තෙක් අවුරුදු එක්දහස් පන්සියයකට ද අධික කාල පරිච්ඡේදයක් අයත් වෙයි. මේ දීර්ඝ කාලයට අයත් සාහිත්‍ය කලා නිර්මාණ එක් යුගයක ප්‍රතිඵල සේ සලකනු ලබයි. ඒ දීර්ඝ කාල පරිච්ඡේදයට ආර්ථික සමෘද්ධිය පැවති අවස්ථා මෙන් ම පරිහාණි අවස්ථා ද අයත් වෙයි.

අදත් සියලු ඉතිහාස කාරයන්, පුරාවිද්‍යාඥයන් හා කලා රසිකයන් මවිතයට පත් කරන්නා වූ දෙවන ආලකමන්දවක් සේ ගැනෙන සීගිරි පුරවරය නිර්මාණය වූයේ පළමු වන කාශ්‍යප රජු සමයේ දී ය. මේ අටළොස් වසක රාජ්‍ය කාලය සතුරු බියෙන් තොර වූ ද, මුළුමනින් ම සාමකාමී වූ ද, එසේ ම ආර්ථික සමෘද්ධිය ස්ථාවර වූ ද වකවානුවක් ලෙස සැකයෙන් තොරව හැඳින්වීම උගහටය. ඉන්දියාවට පැන ගිය මුගලන් කුමරාගේ ප්‍රමුඛත්වයෙන් කොයි මොහොතේ හෝ සතුරු ආක්‍රමණයක් ඇති වීමට ඉඩ තිබිණ. එසේ වුව සියලු පීඩා අමතක කොට සීගිරි නගරය පරිසමාප්තාර්ථයෙන් ම කලාගාරයක් කිරීමට කාශ්‍යප රජ සමත් වූයේය. අනෙක් නිර්මාණ තිබිය දී සීගිරි ගල් බැවුමේ අඳින ලද චිත්‍ර සමූහය ගැන සලකතත් එතරම් අගනා සිතුවම් රැසක් මෙරට කිසි දක නිර්මාණය නුවූ බව අවිවාදයෙන් පිළිගැනේ. කාශ්‍යප රජු දවස සීගිරි පුරවරය කලාගාරයක් වූ නමුත් එකල රටේ අනෙක් කොතැනකවත් සාහිත්‍යකලා පහළ වූ බවක් ද නොපෙනේ. පසුව සීගිරි කැටපත් පවුරේ ලියනු ලැබූ කුරුටු ගී අතර ද උසස් කාව්‍ය නිර්මාණ තිබෙන බව විචාරකයන්ගේ පිළිගැනීමයි. ඒ ගී වලින් වැඩි කොටසක් ලියැවුණ දස වන සහ එකොළොස් වන ශත වර්ෂ වනාහි රට බෙහෙවින් ම ආර්ථික පරිහාණියට පාත්‍ර වූ යුගයකි.

අනුරාධපුර යුගයේ නටබුන් කලා නිර්මාණ පිළිබඳ කාල නිර්ණය සැකයෙන් තොරව පැවසිය හැකි නොවූවත් ඒ යුගයට අයත් බුදු පිළිම, සඳකඩපහණ, මුරගල් ආදී ශ්‍රේෂ්ඨ නිර්මාණ අතුරෙන් සැලකිය යුතු ප්‍රමාණයක් හත් වැනි සියවසට හෝ ඉන් පසු කාලයට අයත් යයි කියනු ලැබේ. මෙම නිර්මාණ පහළ වූයේ රට සමෘද්ධියට පැමිණි යුගයක නොව අනුරාධපුරයේ පෙර තුබූ සමෘද්ධිය පිරිහෙමින් පැවති කාලයකය.

---

6. Lucian Goldmann, *The Hidden God*, London, 1964, p. 49.

පොළොන්නරු යුගය ගැන සලකතත්, ඒ යුගයට අයත් සාහිත්‍ය කෘතීන්ගෙන් වැඩි ගණනක් ලියැවුණේ රට සමෘද්ධියෙන් පිරි මහා පරාක්‍රමබාහු රජු දවස නොව ඉන් පසු කාලයේ දී බව පෙනේ. ඉහත දක්වන ලද ගීය ඇතුළත් සසඳ කව ලියැවුණ ලීලාවතී රජිණගේ කාලය ද යුද කැළඹිලි, ආර්ථික පරිහාණිය හා දේශපාලන අස්ථිරතා පැවති යුගයකි.

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අවධියේ ලියැවුණ සන්දේශ කාව්‍යයන් ගැන සලකන කල කවිත්වය අතින් ඒ කෘතීන් හා සමතන්හි ලා ගිනිය හැකි සන්දේශ කාව්‍ය දෙකක් පහළ කරමින් සිංහල සිවුපද සන්දේශ කාව්‍යාවලිය ආරම්භ කළ ගම්පල යුගය ආර්ථික සමෘද්ධියක් පැවති කාලයක් නොවිය. එද මයූර, තිසර යන සන්දේශ කාව්‍ය දෙක පහළ වීම සඳහා මූලික වශයෙන් රටේ ආර්ථිකය නොව දේශපාලන තත්වය හේතු වූ බව පෙනේ. රාජ බලය දුර්වල වීම හා ප්‍රබල සතුරු පිරිස් ඇති කල්හි දෙවියන්ගේ පිහිට අවශ්‍ය වීම එක හේතුවකි. ලේඛකයන් ගේ පැත්තෙන් සලකන කල පෞද්ගලික ලාභ ප්‍රයෝජන, කීර්ති ප්‍රශංසා අවශ්‍ය වීම තවත් හේතුවකි.

ප්‍රශස්ති කාව්‍යය කෝට්ටේ සවැනි පැරකුම්බා රජු දවස ආරම්භ වුවත් මෙම සාහිත්‍යාංගයේ සංවර්ධනයත් ව්‍යාප්තියත් සිද්ධ වූයේ තදනන්තරව එළඹි ආර්ථික පරිහාණි සමයේ දීය. කෝට්ටේ යුගයෙන් පසු යළි සාහිත්‍යයේ ප්‍රබෝධය ඇති වූ හැම කාල පරිච්ඡේදයක් ගැන ම සලකන කල ඒ එක ද අවස්ථාවකවත් සාහිත්‍යයට ආර්ථික දියුණුව පදනම් වූ බවක් නොපෙනේ.

මෑත භාගයෙහි මෙරට ආරම්භ වූත්, දියුණුවට පත් වූත් සාහිත්‍යාංගයන්ට පසුබිම් වී ඇත්තේ සමාජ - ආර්ථික දියුණුව නොව පරිහාණිය යි කිව හැකි තරම්ය. සිංහල සහරා මෙන් ම පුවත්පත් ද ආරම්භ වූයේ කෙතරම් ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ ද යනු ප්‍රකට කරුණකි. සිංහල නවකතාව ගැන සලකන කල ද එහි දියුණුවත් රටේ ආර්ථික දියුණුවත් අතර සම්බන්ධයක් පැවති බවක් නම් නොපෙනේ.

> 'සිංහල නවකතාව දුන් ළදරු අවධිය පසු කොට ඇති බව කාහට වුවත් පිළිගැනීමට සිදුවනු ඇත. 1944 රේදී මාර්ටින් වික්‍රමසිංහගේ ගම්පෙරළිය පළ වීමෙන් පසු අපේ නවකතා සාහිත්‍යය ළදරු අවධිය පසු කළ බවත් එවක් පටන් අද දක්වා මේ කෙටි කාල සීමාව තුළදී ඉතා සීග්‍රයෙන් මුහුකුරා ගොස් ඇති බවත් අපට පිළිගැනීමට සිදු වෙයි.'[7]

සිංහල නවකතාව ළදරු විය ඉක්මවා පරිණත තත්වයට පත් වූ වකවානුව - එනම් එක්දහස් නවසිය හතළිස් ගණන් මුළු මහත් ලංකා සමාජය මතු නොව සමස්ත ලෝකය ම කැළඹී ගිය වකවානුවකි. දෙවන මහා ලෝක සංග්‍රාමයට ලංකාව කෙළින් ම සම්බන්ධ නොවුවත් ඒ යුද්ධයේ දෝංකාරයෙන් අප රටත් සමාජයත් මුළුමනින් ඇළලී ගොස් තිබිණි. එද මිනිසාගේ මානසික සන්තර්පණය සඳහා එක් අතකින් අශ්ලීල කව් පොත් විශාල වශයෙන් පළ වෙද්දී සිංහල නවකතා ක්ෂේත්‍රයෙහි පරිණත අවස්ථාවට හිමිකම් කියන කෘතිය ද සම්පාදනය වූයේය.

උසස් සාහිත්‍ය පහළ වීම රටේ ආර්ථික දියුණුව, සාමය, සෞඛ්‍ය වර්ධනය, මානසික සන්සුන් බව යනාදි කරුණු මත රඳ පවත්නේ නම් 1944 දී ගම්පෙරළිය වැනි කෘතියක් සම්පාදන වීමට කිසිදු ඉඩක් නැත්තේය. ගම්පෙරළිය ගැන සිතන කල්හි නම් උසස් සාහිත්‍ය නිර්මාණ පහළ වන්නේ අතිශය කැළඹිලි සහිත අවස්ථාවන්හිය යනුවෙන් ලූෂන් ගොල්ඩ්මාන් පළ කළ මතය සනාථ වන බව පෙනේ.

---

7. සරච්චන්ද්‍ර වික්‍රමසූරිය, විජයබාකොල්ලය විවරණය, සමන් ප්‍රකාශකයෝ, මහරගම, 1963, 45පි.–

මේ කරුණු අනුව සලකන කල රටක භෞතික වර්ධනයත් සෞන්දර්යාත්මක දියුණුවත් සමාන්තර ගත වීමක් නොමැති බව පෙනේ. සෞන්දර්ය පක්ෂයේ දියුණුව භෞතික සමෘද්ධියේ ප්‍රතිඵලයක් ද නොවෙයි. භෞතික දියුණුව ඇති කල්හි සාහිත්‍යකලා විෂයෙහි වර්ධනයක් සිද්ධ නොවෙතියි මෙයින් අදහස් නොකෙරේ. මිනිසා ධනාඪ්‍යයෙන් පොහොසත් වෙත් වෙත් ම සාහිත්‍යකලා වඩවඩාත් දියුණු වීම එක ම ධර්මතාව නොවන්නේය. ආර්ථික පක්ෂයෙන් රටක් පොහොසත් වෙත් ම එහි ප්‍රතිඵල වශයෙන් සාහිත්‍ය කලා පෝෂණය වන්නා සේ ම මිනිසාගේ ආර්ථික හා මානසික පරිපීඩනයේ ප්‍රතිඵල වශයෙන් ද උසස් සාහිත්‍යකලා පහළ වන බව මේ අනුව නිගමනය කළ හැකි වෙයි.